# ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන

1. ලක්ඛණ - පරමාර්ථ ධර්මයන්ගේ ලක්ෂණය දෙයාකාර වේ.

    - සාමඤ්ඤලක්ඛණ - පරමාර්ථ ධර්මයන් පැහැදිලි කිරීමේ දී ඇති ඇතැම් ලක්ෂණයන් තමාට පමණක් නොව වෙනත් ධර්මයන්ට ද අදාළ වේ නම් එය සාමඤ්ඤ ලක්ෂණය වේ. (සමානානං භාවො = සාමඤ්ඤං)
      උදා - අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණයන් සියලු සංස්කාර ධර්මයන්ට (සංස්කාර වන නාමරූප ධර්මයන්ට) අදාළ වේ. 'රුප්පන' ලක්ෂණය සියලු රූපයන්ට අදාළ වේ. 'නමන' ලක්ෂණය සියලු නාමයන්ට අදාළ වේ. මේ අනුව මෙම ලක්ෂණයන් තමාට පමණක් අදාළ නොවී වෙනත් ධර්මයන්ට ද අදාළ බැවින් 'සාමඤ්ඤ' වේ.

    - සභාවලක්ඛණ - පරමාර්ථ ධර්මයන් පැහැදිලි කිරීමේ දී යම් ලක්ෂණයක් තමාට පමණක් අදාළ වේ නම් එය සභාව ලක්ඛණ වේ. (සස්ස භාවො = සභාවං)
      උදා - 'ආරම්මණවිජානන' ලක්ෂණය අදාළ වනුයේ චිත්තයට පමණි. 'ඵුසන' ලක්ෂණය අදාළ වනුයේ ඵස්සයට පමණි. 'අනුභවන' ලක්ෂණය අදාළ වනුයේ වේදනාවට පමණි. මේ අනුව මෙම ලක්ෂණයන් තමාට පමණක් අදාළ වන බැවින් 'සභාව' වේ.

2. රස - රසය දෙයාකාර වේ.

    - කිච්ච - ඒ ඒ පරමාර්ථ ධර්මයාට අයත් වන කෘත්‍යය යි.

    - සම්පත්ති - කාරණයන්ට අනුකූල වෙමින් පහළ වීම ද

    - මෙම කිච්ච සහ සම්පත්ති යන දෙක අතරින් ඇතැම් ධර්මයන්ගේ කෘත්‍යය (කිච්ච) ප්‍රකට වේ. ඇතැම් ධර්මයන්ගේ කාරණයන්ට අනුකූලව පහළ වීම (සම්පත්ති) ප්‍රකට වේ.

3. පච්චුපට්ඨාන - වැටහෙන ආකාරය යි. මෙය ද දෙයාකාර වේ

    - ඵලපච්චුපට්ඨාන - කෘත්‍යය හේතුවෙන් පහළ වන ඵලය යි. යම් කෘත්‍යයක් ගෙන සැළකූ විට එම කෘත්‍යයට අදාළව යම් ඵලයක් ඇත්තාක් මෙනි.

    - උපට්ඨානපච්චුපට්ඨාන - පරමාර්ථ ධර්මය මනසිකාරයට නැංවීමේ දී යෝගීන්ගේ ඤාණයට වැටහෙන ආකාරය යි.

4. පදට්ඨාන - පරමාර්ථ ධර්මය පහළ වීමට ආසන්න කාරණය යි. දුරස්ථ කාරණා සහ සමීප කාරණා යන දෙවර්ගය අතරින් සමීප කාරණය 'පදට්ඨාන' වේ. (පදමෙව ඨානං = පදට්ඨානං. මෙහි 'පද' සහ 'ඨාන' යන පද දෙකෙන් ම දැක්වෙනුයේ 'කාරණ' අර්ථය යි).

**අභිධම්මාවතාරයේ ලක්ඛණාදිය සම්බන්ධයෙන් දක්වෙන ගාථාවන්**

633. සාමඤ්ඤං වා සභාවො වා, ධම්මානං ලක්ඛණං මතං;
කිච්චං වා තස්ස සම්පත්ති, රසොති පරිදීපිතො.

(ධම්මානං - පරමාර්ථ ධර්මයන්ගේ; සාමඤ්ඤං වා - බොහෝ දෙනා සමඟ සම්බන්ධ වන ලක්ෂණය ද; සභාවො වා - ස්වකීය ලක්ෂණය ද; ලක්ඛණං - ලක්ෂණය යැයි; මතං - දත යුතු ය. තස්ස - ඒ පරමාර්ථ ධර්මයාගේ; කිච්චං - කෘත්‍යය ද; සම්පත්ති වා - කාරණයන්ට අනුකූල වෙමින් පහළ වීම ද; රසො ඉති - රසය යැයි; පරිදීපයෙ - දැක්වේ).

634. ඵලං වා පච්චුපට්ඨානං, උපට්ඨානනයොපි වා;
ආසන්නකාරණං යං තු, තං පදට්ඨානසඤ්ඤිතං.

(ඵලං වා - ඵලය ද; උපට්ඨානාකාරොපි - යෝගීන්ගේ ඤාණයට වැටහෙන ආකාරය ද; පච්චුපට්ඨානං - පච්චුපට්ඨාන නම් වේ. යං ආසන්නකාරණං - යම් ආසන්න කාරණයක්; (අත්ථි - වේ ද); තං තු - ඒ ආසන්න කාරණය වනාහි; පදට්ඨානසඤ්ඤිතං - පදට්ඨාන යැයි සඤ්ඤිත ය).

(අභිධම්මාවතාර)